# ඇහැට වංගුව

## ධර්මරත්න සහෝදරයෝ

ඒ කාලේ තැටි ගන්න පටි ගන්න සල්ලි නැති මිනිස්සුන්ට ගීත රසවිඳින්න තිබුන එකම මාධ්‍යය වන ගුවන්විදුලියේ වෙළඳ සේවයේ දිනපතා උදේ 8.45 - 9.00 දක්වා පොදුවේ කණ්ඩායම් ගීතවලට දුන්න විනාඩි 15කින් මුළු ලංකාවේ ම ජනප්‍රිය වෙනවා කියන්නේ එසේ මෙසේ ගේමක් නෙවෙයි ලොක්කා. තනියෙන් නම් කමක් නෑ ජේ සහෝදරයෝද, ලොස්කැබරලෙස්, මුන්ස්ටොන්ද, ත්‍රී සිස්ටර්ස් ද කීයක් ද? ඒ අතරින් ධර්මරත්න සහෝදරයෝ ගැන අමුතුවෙන් කියන්න දෙයක් තියෙයිද 70 - 80 දශකයේ රසිකයින්ට. මේ කට්ටිය ඕස්ට්‍රේලියා එනවා කිව්වම අපිව Back to 70s වලට ගෙනියන්න. කව්රු මොනව කිව්වත් චූටි මල්ලි නම් දැනගත්තා කටකැපෙන්න හෝල් එක පිරෙනවා කියලා.



කොච්චර කලාකාරයො වගේම කලාකාරයෝත් මෙහේ නිතරම ආවත් බොක්කටම වැදුන සංගීතයක් බලන්න මිනිස්සු නෑවිත් ඉන්නේ කොහොමද? වයසට ගියාට ට්‍රේඩ් මාක් සින්දු සෙට් එකක්නේ කියලා තියෙන්නේ. "කලකට පෙර " ප්‍රියංගිකා", "ආයුබෝවන්", තෙල් තමයි.

සල්ලි හොයනවා නම් ගෙන්නන්න ඕසෙට කලා කාරයෝ ඉන්න රටේ ධර්මරත්න සහෝදරයෝ වගේ සෙට් එකක් ගෙන්නන්න ගත්ත තීරණයෙම මාර වැලිව් එකක් තියෙනවා. ඒ වෙනුවෙන් මෙන්න ASCA එකට අපේ මෙච්ච එක. බලන්නකෝ වයසට කියලද. මෙල්රෝයි ලොක්කා ලස්සනට තවමත් ලීඩ් කරන ලස්සන චූටි මල්ලි වගේම එදා ආපු බොහොම දෙනෙක් මෙල්රෝයි ජෝතිට මිල්ටන්ට බැක් කරලා තිබුන බවක් දැනගෙන ඉන්න නැහැ. අන්න මල්ලි ටැලන්ට් ඉගෙන ගන්නවනම් කෝටියයි. ඒත් ඉතින් ටැලන්ට් උගන්නන්නේ කෝමද? අනුකරණය නම් කළ හැකි. ඒත් සම කරන්න බැහැනෙ. එච්ච ඉතිං එනකොට ගේන දේවල් තමයි. කණ්ඩායම් සංගීතයේ ක්ලැරන්ස්ගෙන් පස්සේ සුමුදු සංගීත් රසය දෙන්න ඉතිරිවෙලා ඉන්න දැවැන්තයට අපේ සුභ පැතුම්. ඇත්තටම අපිට අතීතයට ගියා තමයි.

## නීතිය නැවිල්ල

මෙහේ කට්ටිය නීතිය අතට අරන් එහෙට මෙහෙට වනල බැලුවට නීතය නවන්නනම් හම්බුවෙන්නේ නැහැ කියලා මේ සතියේ ඔප්පු වුනා. නීතිය උප අගමැතිටත් එකයි කියලා ඔප්පු වුනා. තනතුරු ඉවරයි.

ඒත් මට නම් ප්‍රශ්නෙ මේ පත්වෙලා හිටපු මිනිස්සු මෝඩයෝද මේ ගොල්ලෝ කොහොමද ඔස්ට්‍රේගියානු නීතියට පටහැනිව ගිහින් ඡන්දෙ ඉල්ලන්නේ. අපේක්ෂකයෙකු වශයෙන් දිවුරුම් දීමේදී රටේ මූලික නීතිය නේද උල්ලංගනය කර ඇත්තේ. ඒ නිසාම ඔවුන්ගේ මන්ත්‍රීකම් අහිමි උනේ ඔවුන් ඊට නුසුදුස්සන් නිසානම් කුමන දඬුවමක්ද ඔවුන්ට හිමි.

උප අගමැති තුමා දැනටමත් අතුරු මැතිවරණයකට සූදානම්. සමහර විට ඔහු දැං ඊට සුදුසුකම් හඳුනගෙන ඇත. ඒත් මුල්වර ඔහු විසින් කරන ලද වරද සඳහා



දඬුවමක් නොදී යලිත් අපේක්කයකු වශයෙන් ඉදිරිපත් වන්නේ කුමන සදාචාරයක්ද? ඒකත් හරියට අපේ රටේ තිලක් මාරපන ප්‍රශ්නයක් නිසා ඇමතිකමෙන් ඉල්ලා අස්වී ටික කලකට පසු කිසිම දඬුවමක් නොලබා යලිත් ඇමති ධූරයකට පත් කිරීම වගේ වැඩක් නොවැ.

චූටි මල්ලිගේත් දත කටපූට්ටු වෙන්නේ මෙන්න මේ වගේ වෙලාවල් වලදී තමයි. බලාගෙන ගියාම දැං දැං සේරම හොඳයි තමයි එත් ටිකයි වගේනේ.....

## ලංකාවෙ ටෙලියක් මෙහේ හදන්න අරන්

පහුගිය දවසක ෆෙඩරල් පොලිසිය වෘත්තීය සමිති මූලස්ථානයට කඩා පැනලා ෆයිල් සෙට් තොගයක් අරන් ගිහින්. අරමුණ විරුද්ධ පක්ෂයේ නායකයන්ගේ අතීත මුදල් අවභාවිතාව සම්බන්ධයෙන් චෝදනා ගොනු කරන්න. මාරයිනේ. අවුරුදු දහයකටත් කලින් වුණ දෙයක් ගැන හොයන්න හදිසියෙම




මතක්වුණ එක මාරම මාරයි.

මේක බැලූ බැල්මට ඇත්තටම නීත්‍යානුකූල කාරණාවක් උනාට මුළු රටම දන්නවා ගහන්න හදන ගේම මොකක්ද කියලා. ලංකාවේ අපිටනම් මාර හුරු පුරුදු නාට්‍යයක් නිකන් මෙහේ පෙන්නන්න අරං වගෙයි දැනෙන්නේ.

ආණ්ඩුව නිකං නීතිය අතට අරං වගේ දැනෙනවා. ඒත් තවමත් අපිට රජය ගැන විශ්වාසයක් තියෙනවා මේ රටේ. මොකද රජය කියන්නේ සිස්ටම් එක මිසක් ආණ්ඩුව නොවන නිසා.

මෙතන වැදගත් වෙන්නේ බිල් ෂෝටින් කියන විදිහට මිනිස්සු තමන්ගේ බලය අඩුවෙන විට ඒක රැක ගැනීම පිනිස යොදා ගන්නා ක්‍රියා මාර්ග කුමන වර්ගයේ ඒවාද යන්නයි. මේ වගේ රටක මේවා මෙහෙම වෙනකොට මාර දුකයි ලොක්කා. තනි ඇහැට ඇඬෙන්නේ.

## ඉල් මහ මතක



ඉල් මහේ පිපුණ මල් පෙති මතට
ගිනි දියර ඇද හැලුණ මතකයම
කල් ගියත් නොදැනීම මතුවෙද්දි
හිත රිදෙයි ඇස් වලින් නොපෙණුනත්

මහ පොළොව ඉකිබින්ද කණිසමක
නැහැ දුටුවෙ දෙවියන්ද වෙනතකය
වහ කැවුණ රුදු සතුන් වියරුවක
ඇහැ ගැටුණ කරුමයකි හිත දවන

වල් වැදුණ දේශයක හදවත්
ගල් වුණිද නොමදනිම් තවමත්
කල් ගියත් මේ මතක සවිමත්
මල් පිපෙයි ඉල් මහේ තවමත්

## කුහක වත

කෙනෙක් යම් ජයග්‍රහණයක් ලබපුවහම තමයි කුහකයන් කවුද හොඳ මිනිස්සු කවුද කියල තේරුම් ගන්න පුලුවන්.

කුහකයා අර ජයග්‍රහණය නොදැක්කා වගේ ඉන්නවා. හොඳ මිනිහා ඉදිරියට ඇවිත් සතුට බෙදා ගන්නවා.

ඔන්න බලාගෙන ඉන්න. ප්‍රතිඵලය මාරයි.

## මෙල්බර්න් - කොළඹ

මෙල්බර්න් - කොළඹ සෘජු ගුවන් සේවය ආරම්භ වුනා. ඒක ගැන මාර සතුටුයි. සංගලා මහේලලා ඇවිත් ඒ මංගල ගමනට. ඒකටත් මාර සතුටුයි. දැන් ඉතින් අපට අතන මෙතන රස්තියාදු නොවී කෙළින්ම ගෙදර පුලුවන්.

අනික් අතින් ලංකාවෙ ඉඳන් මෙහෙ එන අම්මලාට තාත්තලාට කෙළින්ම කොළඹින් නැගලා මෙල්බන් වලින් බහින්න පුලුවන් එක එක එයාපෝට් වල රස්තියාදු වෙවී දුක් විඳින්නෙ නැතිව.

ඒ කතා එහෙම වුණාට පහුගිය දවස්වල මේ ගුවන්සේවය ලබපු පාඩු ගැන අහපු කතන්දර මතක්වෙද්දි මේ ගුවන් සේවය ගොඩ යන්නෙ කවදද කියන ප්‍රශ්නයත් හිතේ ඇතිවෙනවා. ඒක ගැන හිතමු. මොකද ඒක රටේ ප්‍රශ්නයක් නිසා.

ඉතින් අපි ඒකට මොකද කරන්නෙ? මොනවද අපට කරන්න පුලුවන්?

මේ සෘජු ගුවන් ගමන නිසා ශ්‍රී ලංකන් එකට මැලේසියන් එමිරේට්ස් සිංගප්පූර් ගුවන්සේවා එක්ක මාර තරගයක් දෙන්න වෙනවා. දැක්කනෙ පහුලිය දවස්වල කට්ටිය තරගෙට රේට්ස් බස්සපු හැටි. අපේ අය කරන්නෙ ඩොලර් පහක් හරි අඩුවෙන් දෙන තැනට යන එකනෙ. දැන් එහෙම නොකර ඩොලර් පහක් දහයක් වැඩි වුණාත් අපේ ගුවන් සේවයේ යන්න අපේ අය පුරුදුවෙන්න ඕනෙ කියලයි චූටි මල්ලි හිතන්නෙ. ලංකාවට යන්නෙත් ඉතින් අවුරුද්දකට දෙකකට සැරයක් නිසා අපටත් බැරි කමක් නැහැ අපේ ගුවන් සේවයට සප් එකක් දෙන්න.




එහෙම කරලා ශ්‍රී ලංකන් ගුවන් සේවය ගොඩගන්න අපට බැරි වෙන්න පුලුවන්. එත් මේ මෙල්බන් කොළඹ ගුවන් සේවය නොකඩවා දිගටම පවත්වාගෙන යන්න අපට දෙන්න පුලුවන් සහයෝගය අපි දිය යුතුමයි. බොරු දේශප්‍රේමී ටෝක්ස් වලට වඩා එහෙම ප්‍රායෝගික වැඩක් කෝටියක් වටිනවා.

අතින් කයිට් කරගෙන හරි ශ්‍රී ලංකන් එක හොඳ සර්විස් එකක් දෙයි. එළකිරි වගේ. අපිත් අපේ පැත්තෙන් දෙන්න පුලුවන් සහයෝගයක් දෙමු.

**චූටි මල්ලි**